## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය – 2017/2018**

**SOC 4283 – ප්‍රචණ්ඩත්වය සහ ගැටුම් සම්බන්ධ මනෝ විද්‍යාත්මක ගැටලු**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. 'ප්‍රචණ්ඩත්වය යන සංකල්පයෙන් එක් ප්‍රචණ්ඩත්ව වර්ගයක් පමණක් අදහස් නොවන අතර ප්‍රචණ්ඩත්වයේ විවිධ වර්ග පිළිබඳව අවධානය යොමු කරන බව වටහා ගැනීමට ශ්‍රී ලාංකේය සමාජය හොඳ උදාහරණයකි.' මෙම ප්‍රකාශය විචාරාත්මකව සාකච්ඡා කරන්න.

2. i පශ්චාත් ව්‍යසන ක්ලමථ අක්‍රමිකතාවෙහි (Post-Traumatic Stress Disorder) රෝග ලක්ෂණ මොනවා ද?

   ii යුධමය තත්ත්වයන් පශ්චාත් ව්‍යසන ක්ලමථ අක්‍රමිකතාව (Post-Traumatic Stress Disorder) මතුවීමට තුඩුදෙන ආකාරය 'ඩියර් හන්ටර්' (Deer Hunter) චිත්‍රපටය හා අනෙකුත් සුදුසු උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

3. 'ක්ෂතිය පිළිබඳ පර්යේෂණ' (Trauma research) වල නියැලෙන පර්යේෂකයෙකු විවිධ චිත්තවේගීය ගැටළු වලට මුහුණ දෙන අතර ඔහුට/ඇයට ආචාරධර්මීය රාමුවක් අනුගමනය කිරීමට සිදුවේ. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? සාකච්ඡා කරන්න.

4. මනෝ සමාජීය මැදිහත්වීම් වලදී 'ප්‍රත්‍යස්ථිතිය' (Resilience) සහ 'ක්ෂතිය' (Trauma) යන විවාද දෙක Alastair Ager විසින් සම්බන්ධ කළ ආකාරය කෙසේදැයි ඔහුගේ 'Implications for the planning of interventions with war-affected populations' යන ලිපිය ඇසුරෙන් පැහැදිලි කරන්න.

5. සරණාගත අත්දැකීමේ පියවර දරුවන් හා Mrs Peyti ගේ ප්‍රත්‍යයක අධ්‍යයනය ඇසුරින් පැහැදිලි කරන්න.

6. මනෝ සමාජීය වැඩ කණ්ඩායමේ (Psycho-social Working Group) මනෝ සමාජීය සංකල්පීය රාමුව (Psycho-social Conceptual Framework) බලපෑමට ලක්වූ පුද්ගලයන්ගේ අභ්‍යන්තරික සහ බාහිර ලෝකයන් සම්බන්ධ කරන්නේ කෙසේදැයි යන්න විචාරාත්මකව විමසන්න.

*************